# ගැබිණි මව්වරුන් සඳහා රු.20,000/- ක පෝෂණීය දීමනාවක් ලබාදීමේ වැඩසටහන

සුදුසුකම්

- ගර්භනී වී මාස 03ක් සම්පූර්ණ වීම
- කොට්ඨාසය තුළ මාතෘ සායන සඳහා සහභාගී වීම

ඔබ සහභාගී වන සායන මධ්‍යස්ථාන / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර, ඔබ ස්ථිරවම පදිංචි වසමේ ග්‍රාම නිලධාරීගෙන් පදිංචිය සහතික කර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනයගේ නිර්දේශය සහ දැනට සහභාගී වන මාතෘ සායනයේ සායනභාර වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය සහිතව ගැබ්ගෙන මාස 03ක් ඉක්මවීමට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල් ළමාවිය සංවර්ධන නිලධාරී හෝ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන නිලධාරී වෙත භාර දෙන්න.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය භාරදිය යුත්තේ ඔබ සහභාගී වන මාතෘ සායනය අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වේ.

ඔබගේ අයදුම්පත්‍රය සමඟ ගැබිණි සටහන්පතේ පිටපතක් අමුණා තබන්න.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වවුචර්පත් පොත ලද පසු මෙම වැඩසටහනට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වෙළඳ ආයතන වෙතින් අදාල මාසයේ වවුචර්පත්‍රයට හිමි ආහාර ද්‍රව්‍ය ලබා ගත හැකිය.එක් වවුචර්පත්‍රයක වටිනාකම රු.2000/- වන අතර එක් ආයතනයකින් එකවර රු.2000/-ට සරිලන නිර්දේශිත ද්‍රව්‍ය ලබාගත යුතුය.

ආහාර ද්‍රව්‍ය ලබාගැනීමේදී වවුචර්පතේ පසුපිටෙහි සඳහන්ව ඇති නිර්දේශිත ආහාර ද්‍රව්‍ය පමණක් ලබාගත යුතුය.එම නිර්දේශිත ආහාර ද්‍රව්‍ය වලින් ආහාර වර්ග අවම වශයෙන් 05ක්වත් ලබාගත යුතු අතර ආහාර කාණ්ඩ කිහිපයක් නියෝජනය වන පරිදි ආහාර වර්ග තෝරාගත යුතුය.

නිර්දේශිත ආහාර ද්‍රව්‍ය කාණ්ඩ හැර වෙනත් කාණ්ඩයන් හෝ මුදල් ගැනීමක් සිදුවූ වහාම ඔබට හිමි සියලු වවුචර් පත්‍ර අවලංගු කිරීමට සිදුවනු ඇත.

ඔබ පසු කරන්නේ සුවිශේෂ කාල පරිච්ඡේදයක් බැවින් සැමවිටම වස විසෙන් තොර, ස්වභාවික පෝෂණ ද්‍රව්‍ය ලබාගැනීම හා යහපත් මානසික තත්ත්වයක් පවත්වාගැනීම මඟින් යහපත් දරුවකු බිහිකිරීමේ ගෞරවය ඔබට හිමිවනු ඇත.